# ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුරවැසි ප්‍රඥප්තිය

## දැක්ම

සාමකාමී සමුද්‍රීය පරිසරයක් තුලින් ජාතික සුභ සිද්ධිය ආරක්ෂා කිරීම

## ආයතනයේ මෙහෙවර

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අරමුණ වන්නේ සමුද්‍රීය කලාපයේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, පවිත්‍රතාවය සහතික කොට බලාත්මක නීතිය ක්‍රියාත්මක කිරීම වේ. සමුද්‍රීය ජෛව විවිධත්ව කළමනාකරණයට සහය වී ස්වභාවික හා මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන ව්‍යවසනයන්හිදී සිදුවන්නා වූ ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමද අපගේ වගකීම වේ.

## ආයතනයේ අගයන්

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සන්නද්ධ සේවා ගණයට අයත් නොවන නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ආයතනයකි. මෙමගින් ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාපයේ නීතිය හා සාමය බලාත්මක කිරීම හා සම්බන්ධ වෙරළ ආරක්ෂක සේවාවන් ඉටු කරනු ලබයි.

## අරමුණ

සමුද්‍රීය පරිසරය සුරක්ෂිත කිරීම තුලින් පරිසරයේ සමතුලිතතාවය පවත්වා ගැනිම, සමුද්‍ර දූෂණය වලක්වා ගැනීම වෙනුවෙන් නීතිය බලාත්මක කිරීමට උරදීම අපගේ අරමුණ වේ.

## ආයතනයේ විධි නියමය (Mandate)

වෙරළබඩ ප්‍රදේශවල, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කළාපවල සහ ගැඹුරු මුහුදේ ආරක්ෂාව සහතික කිරිමේ කාර්‍ය සඳහා වෙරළ ආරක්ෂක සේවාව යනුවෙන් හඳුන්වනු ලබන බහුවිධ කාර්‍ය සේවාවක් පිහිටුවීමට 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක පනත මඟින් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

## ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් සැපයෙන සේවාවන්

අ. ශ්‍රී ලංකා මුහුදු කලාපයන්හි නීති විරෝධී මසුන් ඇල්ලීම වැලැක්වීම සහ මුහුදේදී සහය ලබාදීමද ඇතුළුව ධීවරයින් ආරක්ෂා කිරීම.

ආ. නීතිවිරෝධී භාණ්ඩ ඝාවාරම් කිරීමට එරෙහිව සහ ආගමනයට එරෙහිව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව සහ අදාළ ආයතනයන්ට අවශ්‍ය සහයෝගය ලබාදීම.

ඇ. මුහුදේදී සිදුවන මුහුදු මංකොල්ලකෑම් වැලැක්වීම හා කළමනාකරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම

ඈ. සමුද්‍රීය කලාපය තුල සහ ශ්‍රී ලංකාවේ දේශිය ජලතීරයේ සිදුවන ත්‍රස්තවාදී ක්‍රියාකාරම් මර්ධනය කිරීමේ අරමුණින් නීතිය බලාත්මක කිරිමේ ආයතන සහ සන්නද්ධ හමුදාවන් සමග සහයෝගීව කටයුතු කිරීම.

ඊ. මුහුදේදී ජීවිත හා දේපල වල සුරක්ෂිතභාවය තහවුරු කිරිම.

උ. ස්වභාවික ව්‍යසනයක් සිදු වූ අවස්ථාවන්හිදී ජීවිත ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා සහභාගීවීම, ආරක්ෂා කිරීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ එකී ව්‍යසන සහ මුහුදේ සිදුවන වෙනත් භාණ්ඩ සම්බන්ධයෙන් වූ යාත්‍රා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබාදිම.

ඌ. සමුද්‍රීය සහ සමුද්‍රාසන්න පරිසරය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.

එ. සමුද්‍රීය දූෂණය ඇතුළු මුහුදේදී සිදුවන වෙනත් ව්‍යසන වැලැක්වීම, පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ නියාමනය කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීම.

ඒ. සමුද්‍රීය සත්ව හා ශාක විශේෂ සංරක්ෂණය කිරීම.

ඕ. ශ්‍රී ලංකාවට නීතිවිරෝධී සංක්‍රමණිකයන්, ආගමනිකයන් ඇතුළුවීම සහ විගමනිකයින් පිටවීම වැළැක්වීම, මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය ඝාවාරම් කිරීම වැළැක්වීම, තහනම් බඩු හා අවි ආයුධ සොයා ගැනීම හා අත්අඩංගුවට ගැනීම.

ක. ශ්‍රී ලංකාවේ මුහුදු තීරයට විජාතික ධීවර යාත්‍රා අනවසරයෙන් ඇතුළුවීම, නීතිවිරෝධී ධීවර කටයුතු වල නිරතවීම වැළැක්වීමත් අත්අඩංගුවට ගැනීම සහ නීතිය ඉදිරියට පැමිණවීමටත් කටයුතු කිරීම.

ග. මුහුදේදී ආපදාවට ලක්වන නෞකා/ යාත්‍රාවන්ට සහ එම නෞකා/ යාත්‍රාවන්හි සිට සොයාගනු ලබන තැනැත්තන් සඳහා අවශ්‍ය සහය ලබා දීම.

ච. මුහුදේදී හෝ අභ්‍යන්තර ජල තීරයේ සිදුවිය හැකි තෙල් කාන්දුවීම් පැතිරයාම වැලැක්වීම සහ පාලනය මඟින් සිදුවිය හැකි පරිසර හානිය වැළැක්වීම.

ඡ. රජය විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත කාලානුරූපව ලබාදෙන හෝ පවරන අනෙකුත් කයී භාරයන් ඉටු කිරිම.

## වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව හැඳින්වීම

ශ්‍රී ලංකාව තුල බලාත්මක නීති රෙගුලාසි උල්ලංගණය කිරීම වැලැක්වීම, උල්ලංගණය කරන්නන් නීතියේ රැහැනට හසුකර ගැනීම සහ සාගරය හා සම්බන්ධ වූ බොහෝ කටයුතු ඉටු කර ගැනීමේ අරමුණින් යුතුව පාර්ලිමේන්තුව මඟින් 2009 අංක 41 දරණ වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තු පනත සම්මත කර ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇත.

## ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව සතු බලතල

අ. ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුව 2009 අංක 41 දරණ වෙරළ ආරක්‍ෂක පනත මඟින් බලාත්මක කර ඇත.

ආ. ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක පුද්ගලයන් සාම නිලධාරීන් වශයෙන් සැලකනු ලැබේ.

ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තු පනතේ 06 වන වගන්තියට අනුව 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ අර්ථානුකූලව සහ එහි කයී සඳහා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවේ සෑම වෙරළ ආරක්‍ෂක පුද්ගලයෙකුම සාම නිලධාරියෙකු ලෙස සලකනු ලැබේ.

ඇ. ශ්‍රී ලංකා වෙරළ ආරක්‍ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්ත පුද්ගලයන් හට සාම නිලධාරින් ලෙස පහත දක්වා ඇති ක්‍රියා මාර්ග ගත හැක.

(1). රජය විසින් ලබාදෙනු ලැබිය හැකි හෝ පවරන ලද කයී ඉටු කිරීම.
(2). අවි ආයුධ රැගෙනයාම.
(3). අපරාධකරුවන් හෝ සැකකරුවන් ලුහුබැඳ යාම.
(4). යම් ස්ථානයක්, ව්‍යුහයක්, යාත්‍රාවක් හෝ ගුවන්යානයක් නැවැත්වීම, ඇතුළුවීම, ගොඩවීම, පරීක්‍ෂා කිරීම, සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම හෝ රඳවාතබා ගැනීම.
(5). ශ්‍රී ලංකාවේ පවතින ඕනෑම ලිඛිත නීතියක් යටතේ වරදක් සිදුකර ඇති බවට සැක කටයුතු පුද්ගලයකු අත්අඩංගුවට ගැනීම.
(6). යම් මසුන්, ද්‍රව්‍ය, උපකරණ, භාණ්ඩ, යාත්‍රාවක්, ගුවන්යානයක් හෝ වෙනත් අයිතමයක් - පරීක්‍ෂා කිරීම, තහනමට ගැනීම හෝ බැහැර කිරීම.
(7). වැරදි විමර්ශනය කිරීම.
(8). යාත්‍රාවේ සේවක පිරිස සහ මඟින්ගෙන් ප්‍රශ්න කිරීම.
(9). නාවික ලිපි ලේඛන, යාත්‍රාවක අනන්‍යතාවය සහ විස්තර ඉදිරිපත් කිරීමට අණ කිරීම.
(10). යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, වාර්තාවක්, සහතිකයක් හෝ වෙනත් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටීම, පරීක්‍ෂාකිරීම, පිටපත් ගැනීම හෝ උද්ධෘත බලා ගැනීම.

## **පැමිණිලි හා යෝජනා ලබා දීමේ ක්‍රමවේදය**

**අ.** **සේවාලාභී මහජනතාව වන ඔබෙන් ඉදිරිපත්වන පැමිණිලි හා යෝජනා අපි ඉතා සතුටින් භාරගන්නෙමු.**

**ආ.** **හදිසි දැනුම්දීම් සඳහා ක්ෂණික දුරකථන අංක 106 ඔස්සේ අප ආයතනය හා සම්බන්ධ විය හැකිය.**

**ඇ.** **ඔබ අප ආයතනය සමඟ සම්බන්ධ වීමට අපේක්ෂා කරන්නේ නම් 041 – 7501200 යන දුරකථන අංකය අමතන්න.**

**ඈ.** **අප ආයතනය පිළිබඳ වැඩිදුර තොරතුරු www.coastguard.gov.lk වෙබ් අඩවිය මඟින්ද ලබාගත හැක.**

- ❖ පුරවැසි සේවාලාභි ප්‍රඥප්තිය, අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා ඔබත් අපත් එක්ව දරණ සාමුහික ප්‍රයත්නයකි.